සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගැලපෙන පිළිතුරට අදාළ අංකය තිත් ඉර මත ලියන්න

---

(01) බෙන්තර ගලපාත විහාරයේ උළුවස්සේ උඩැක්කි, බෙර, හොරණෑ ඇතුලත් රූකම් අයත් වන්නේ කුමන යුගයටද ?
(1) මහනුවර (2) අනුරාධපුර
(3) ගම්පොල (4) පොළොන්නරු (........)

(02) ''මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්.'' ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර යටිකයේ වැඩ දැමූ වස්ත්‍ර ඇත්තේය.'' මෙය සටහන්කර ඇත්තේ,
(1) 2 වන රාජසිංහ රජු කල ස්පිල් බර්ජන්ය.
(2) 2 වන රාජසිංහ රජු කල ඉබන් බතුතා.
(3) 2 වන රාජසිංහ රජු කල රොබට් නොක්ස්ය.
(4) ශ්‍රී වීර පරාක්‍රම රජු දවස ස්පිල් බර්ජන්ය. (........)

(03) හවරිය, පනාව, කැඩපත, මාල, වළලු යනාදී රංග උපකරණ යොදාගන්නා නාට්‍ය පෙළපාලිය වන්නේ,
(1) කපුයක්කාරිය. (2) නානුමුරය.
(3) දරු නැළවිල්ල. (4) පැදුරේ දූපවිල්ල. (........)

(04) ත්‍රිවිධ රත්නය මුල්කර ගෙන පවත්වන ශාන්ති කර්මයකි.
(1) දොවොල් මඩුව. (2) බලි යාගය.
(3) සූනියම් යාගය. (4) දහඅට සන්නිය. (........)

(05) ගවයින්ට වැළඳෙන රෝග ආදියෙන් මිදීමට හා සශ්‍රීකත්වය අරමුණු කරගනිමින් පවත්වන ශාන්තිකර්මයකි.
(1) දොවොල් මඩුව. (2) ගම් මඩුව.
(3) ගරා මඩුව. (4) කිරි මඩුව. (........)

(06) රිද්දී බිසවුන් වන්නේ,
(1) මුදුන්මාල, කොණ්ඩමාල, රනකපාල.
(2) මුදුන්මාල, ආයුපාල, රනකපාල.
(3) කොණ්ඩමාල, ගිරිමේකල, ආසුපාල.
(4) රනකපාල, කාලි, ආයුපාල. (........)

(07) ආලවෙලා පියසේ පටන් මට කෝල නැතිව සබයේ මෙදෑන් ............. මෙම කවිය ගයන්නේ,
(1) සොකරි. (2) පුරන්සිනා.
(3) නොංචි. (4) ලෙන්චිනා. (........)

(08) කර්ණාටක සංගීත සම්ප්‍රදායට අනුව නර්තන සිදුකරන භාරතීය නර්තන සම්ප්‍රදායන් දෙක වනුයේ,
(1) භරත හා කථක්. (2) කථක් හා මණිපූරි.
(3) මණිපූරි හා කථකලි. (4) කථකලි හා භරත. (........)

(09) භරත නාට්‍ය උගන්වන ප්‍රධාන ආයතනයක් වන්නේ,

(1) ආඩියාර්හි කලා ක්ෂේත්‍රය.
(2) කේරල කලා මණ්ඩලය.
(3) විශ්ව භාරතීය විශ්ව විද්‍යාලය.
(4) ශාන්ති නිකේතනය. (........)

(10) කථකලි වල මූලික අභ්‍යාසය හඳුන්වන්නේ,

| | | |
|---|---|---|
| (1) අඩව් | (2) කච්චකෙට්ට | |
| (3) නාට් අඩව් | (4) පදම් | (........) |

(11) ශබ්දම් හා අෂ්ඨ කලාසම් යන නර්තන අංග ඇතුලත් වන්නේ,

(1) භරත හා කථක් නැටුමේ.
(2) කථකලි හා මණිපූරි නැටුමේ.
(3) කථක් හා මණිපූරි නැටුමේ.
(4) භරත හා කථකලි නැටුමේ. (........)

(12) භරත හා කථක් නර්තන වර්ධනය කිරීමට දායක වූ ශිල්පීන් වශයෙන් සැලකෙන්නේ,

(1) නවාබ් වජිඩ් අලිෂා හා වල්ලිකෝල් නාරායන මෙනන්.
(2) බාල වීර කේරල වර්මා හා රවීන්ද්‍රනාත් තාගෝර්.
(3) කාන්ජාවුර් සහෝදරයෝ හා නවාබ් වජිඩ් අලිෂා.
(4) චින්නයියා හා රුක්මනි දේවිය අරුන්ඩේල්. (........)

(13) 10 හා 11 වන ගොඩ සරඹයන්හි සරඹ නාමය වන්නේ,

(1) දැල අඩිය හා පැනීමේ සරඹය.
(2) බඹර සරඹය හා පැනීමේ සරඹය.
(3) චන්ද්‍රිකා සරඹය හා අර්ධ චක්‍ර සරඹය.
(4) පැනීමේ සරඹය හා අංගහාර සරඹය. (........)

(14) නාට්‍යමය අවස්ථා වැඩි වශයෙන් දක්නට ලැබෙන ශාන්තිකර්ම වන්නේ,

| | | |
|---|---|---|
| (1) පහන් මඩුව හා කිරි මඩුව. | (2) රටයකුම හා කිරි මඩුව. | |
| (3) රටයකුම හා සන්නියකුම. | (4) පහන් මඩුව හා ගී මඩුව. | (........) |

(15) දෙවොල් බෙරය හා හොරණෑව අයත් වන්නේ,

| | | |
|---|---|---|
| (1) ආතතයට හා ඝනයට. | (2) ආතතවිතතයට හා සුසිරයට. | |
| (3) ආතතයට හා සුසිරයට. | (4) විතතයට හා අතතයට. | (........) |

(16) උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ එන අවුල් හැරය පළඳින්නේ,

| | | |
|---|---|---|
| (1) පපු ප්‍රදේශයට. | (2) ඉණට. | |
| (3) හිසට. | (4) දෙඅත්වලට. | (........) |

(17) පානා අසිරි නොහැර පාන දෙනෙත් කුසුම .............. මෙම ගීතය,

| | | |
|---|---|---|
| (1) යාග කවියක්. | (2) ප්‍රශස්තියක්. | |
| (3) මල් යහන් කවියක්. | (4) හටන් කවියක්. | (........) |

(18) පොකුරු බෙරය හා එකැස් බෙරය යනු,

| | | |
|---|---|---|
| (1) තම්මැට්මට හා දවුල. | (2) දඬු බෙරය හා බුම්මැඩිය. | |
| (3) යක් බෙරය හා උඩැක්කිය. | (4) තම්මැට්ටම හා රබාන. | (........) |

The National e-learning Portal for The General Education

(19) උඩරට වන්නම් රචනා කළායයි සැලකෙන්නේ,

(1) ගණිතාලංකාර හා මල්වතු විහාරවාසී හිමිනම
(2) ගණිතාලංකාර හා හරණ ගණිතයා
(3) හරණ ගණිතයා හා රම්මොලවක
(4) ගණිතාලංකාර හා මහවලතැන්න (........)

(20) අධ්‍යතන ගීත නාට්‍ය දෙකකි.

(1) දෙපානෝ හා කැලෑ මල්. (2) මානසවිල හා සිංහබාහු.
(3) සිංහබාහු හා දෙපානෝ. (4) නරිබෑණා හා හුණුවටයේ කතාව (........)

(21) ග්‍රහ පන්ති කවි ගායනය කරන ශාන්තිකර්මය වන්නේ,

(1) බලි ශාන්තිකර්ම. (2) දහඅට සන්නිය.
(3) රිද්දි යාගය. (4) සූනියම් යාගය. (........)

(22) හේවිසි වාදනයට යොදාගන්නා අවනද්ධ භාණ්ඩ දෙකකි.

(1) හොරණෑව හා දවුල. (2) දවුල හා තම්මැට්ටම.
(3) ගැටබෙරය හා තම්මැට්ටම (4) දෙවොල් බෙරය හා උඩැක්කිය. (........)

(23) ''අර බලන්න අර ගිරව්ගෙ පැටියෝ ...'' මෙහි සඳස්මත් ගණන වන්නේ,

(1) 16 කි. (2) 18 කි.
(3) 14 කි. (4) 12 කි. (........)

(24) කොහොඹාකංකාරියේ නාට්‍යමය ලක්ෂණ දක්නට ලැබෙන අවස්ථා දෙකකි.

(1) ගුරුගේ මාලාව, යකුන් පද. (2) යක්කම්, ගබඩා කොල්ලය.
(3) මුවමල පිදීම, ආවැන්දුම. (4) හත් පදය, කෙහොඹා හැල්ල. (........)

(25) මාත්‍රා 3 නේ තිතට හා මාත්‍රා 3 + 4 තිතට නටන වන්නම් දෙකකි.

(1) උදාර වන්නම හා කිරලා වන්නම. (2) වෛරොඩි වන්නම හා මයුරා වන්නම.
(3) නයිඅඩි වන්නම හා සැවුලා වන්නම. (4) ගජගා වන්නම හා හනුමා වන්නම. (........)

- **පහත ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. රංග වින්‍යාසයේ දී අවකාශය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

1. ........................................................................ 2. ...........................................................................

27. නර්තනය පිළිබඳ තොරතුරු ලබාගත හැකි අනුරාධපුර යුගයට අයත් සෙල්ලිපි දෙක නම්කරන්න.

1. ........................................................................ 2. ...........................................................................

28. ශාන්තිකර්ම වල බොහෝ සේ සමානතා දක්වෙන ශාන්තිකර්ම දෙකක් ලියන්න.

1. ........................................................................ 2. ...........................................................................

29. තාල සංකල්පයේදී ඇදෙන හා නොඇදෙන ස්වර හඳුන්වන්නේ කුමන නමකින්ද ?

1. ........................................................................ 2. ...........................................................................

30. බලි ශාන්තිකර්මයේ දක්නට ලැබෙන සුවිශේෂී ගායනා දෙකක් නම්කරන්න.

1. ........................................................................ 2. ...........................................................................

31. කථකලි වල වේෂ නිරූපණ ක්‍රම දෙකක් නම් කරන්න.
   1. ............................................................................ 2. ..............................................................................

32. මෘදංග හා තබ්ලාව යොදාගන්නා ඉන්දීය නර්තන සම්ප්‍රදායයන් දෙක නම් කරන්න.
   1. ............................................................................ 2. ..............................................................................

33. කුවේණියගේ දරුවන් දෙදෙනා නම්කරන්න.
   1. ............................................................................ 2. ..............................................................................

34. වෙස් මුහුණු පැළඳ නටන ලංකාවේ ගැමි නාටක දෙකක් නම්කරන්න.
   1. ............................................................................ 2. ..............................................................................

35. පත්තිනි දෙවියන් ඇදහීම ප්‍රමුඛ කොටගත් සබරගමු ශාන්තිකර්ම දෙකක් නම්කරන්න.
   1. ............................................................................ 2. ..............................................................................

36. යාතු කර්මවල කොට්ටෝරුවා .......................................................................................... යන නමින්ද හැඳින්වේ.

37. ගඩලාදෙණිය හා යාපහුව, ඇම්බැක්කේ යන සිද්ධස්ථානවලින් හමුවන නර්තන රූපවලින් ............................................................................................................................. නර්තන සම්ප්‍රදාය හෙළිවේ.

38. උනුනු පියන නමැති රංග භාණ්ඩය යොදා ගන්නේ ............................................................ ශාන්තිකර්මයටය.

39. උඩරට කංකාරි මඩුවලදී යක්දෙස්සන් අඳිනු ලබන වෙස් ඇඳුම ........................................................ රජුගේ දේවාභරණ කට්ටලය සංකේතවත් කරයි.

40. රූපවතී බිසව නළඟනක් සේ ප්‍රකටය. ඇය ............................................................................ රජුගේ බිසවයි.

41. තඹරාවිට වෙදමහතාගේ චරිතය දක්නට ලැබෙන්නේ ................................................................... නාටකයේය.

42. මලය තුන් කට්ටුව කැඳවාගෙන ඒමට ගියේ උෟරු වෙස් ගත් ........................................................................ ය.

43. හින්දු දේවාලවල දෙවියන් වෙනුවෙන් කැපවී සිටින නර්තනිකයන් .................................... නමින් හැඳින්වේ.

44. රජයේ ලලිත කලායතනයේ ආරම්භකයා ලෙස ....................................................... මහතා සඳහන් කළ හැක.

45. සව්රිස් සිල්වා හා කේ. එස්. ප්‍රනාන්දු ගුරු ....................................................................................... නර්තන කලාවට මහත් සේවයක් කළ පාරම්පරික නර්තන ශිල්පීන් දෙදෙනෙකි.

46. කරදිය මුද්‍රා නාට්‍යයේ සංගීත නිර්මාණය කළ ශිල්පියෙක් ලෙස ............................................ හඳුනාගත හැක.

47. මැටි වලින් අඹන ලද හෝ රෙදි කඩක සිතුවම් කරන ලද රූප විශේෂය ........................... නමින් හැඳින්වේ.

48. නන්දිකේශ්වර විසින් රචිත .................................................................... තුළ සතර අභිනයට අදාළ කරුණු වේ.

49. දාන පහ හා කතා පහ ............................................................................................. ශාන්තිකර්මයේ ඇතුලත්ය.

50. ශෘංගාර රසය ඇති වන්නේ ..................................................................................... භාවය වූ විටදීය.

(2 x 50 = 100)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය - II

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- I වන කොටසින් ප්‍රශ්න 2 ක් ද, II, III, IV කොටස් වලින් ප්‍රශ්න එක බැගින්ද තෝරා ගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. (i) තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං
ගත් තත් ජිං තරිකිට ................
මෙම බෙර පදය ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

(ii) යනෙන කලුගඟ එතෙර වැඩ සිට රුපුන් යන මං බලව බලවා
දිලෙන රන් අතට අරගෙන විදුලියක් මෙන් ලෙලව ලෙලවා....
මෙම කවි පද දෙක ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 06)

(iii) දොං ජිංත ගත දොංත වට්ටමේ පදය සහ අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 08)

02. උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්ම ගණනාවකි.

(i) උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් ශාන්තිකර්ම 03 ක් හඳුන්වන්න. (ලකුණු 06)

(ii) එහි අන්තර්ගත නර්තන අංග දෙකක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ශාන්තිකර්මයේ පැවැත්මට බලපෑ සමාජ හා ආගමික පසුබිම විමසන්න. (ලකුණු 08)

03. (i) දේශීය නර්තන සම්ප්‍රදායයන් උඩරට, පහතරට හා සබරගමු වශයෙන් වෙනස්වන ආකාරය පහදන්න. (ලකුණු 10)

(ii) උඩරට වෙස් ඇඳුම් කට්ටලය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 10)

## II කොටස

04. ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ විකාශනය පිළිබඳ ලිඛිත මූලාශ්‍ර වලින් සාධක හමුවේ.

(i) අනුරාධපුර යුගයෙන් හමුවන ලිඛිත මූලාශ්‍ර මොනවාදැයි නම් කරන්න. (ලකුණු 06)

(ii) නර්තනය පිළිබඳ එකල ලැබුණු රාජ්‍ය අනුග්‍රහය විමසන්න. (ලකුණු 06)

(iii) පොළොන්නරු යුගයේදී හින්දු ආභාෂය ලැබුණ බවට වන කරුණු පිළිබඳව විමසන්න. (ලකුණු 08)

05. (i) ''ගැමි නැටුම් තුළින් ගැමියාගේ නිර්ව්‍යාජ බව හා සරල බව එළිදැක්වේ. ''මෙම ප්‍රකාශය විමසන්න. (ලකුණු 10)

(ii) කෝලම් නාටකවල එන චරිත නිරූපණයේ විශේෂතා උදාහරණ ඇසුරින් පහදන්න. (ලකුණු 10)

## III කොටස

06. භරත නර්තන සම්ප්‍රදායය යනු දක්ෂිණ භාරතයේ සුවිශේෂී නර්තන සම්ප්‍රදායයකි. එම සම්ප්‍රදායයට අදාළ වන,

(i) තාන්ජාවුර් සහෝදරයෝ (ලකුණු 06)

(ii) ශබ්දම් පදම් (ලකුණු 06)

(iii) මෘදංගය නටුවාංගම් (ලකුණු 08)

යන මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

07. (i) දේශීය මුද්‍රා නාටක කලාවට මෙහෙවරක් සිදුකළ ප්‍රේමකුමාර එපිටවෙල ශූරීන්ගේ කාර්යභාරය පහදන්න. (ලකුණු 10)

(ii) කරදිය මුද්‍රා නාට්‍යය සුවිශේෂී වීමට හේතු කාරණා විස්තර කරන්න. (ලකුණු 10)

## IV කොටස

08. නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි බලපා ඇති සාධක රැසකි.

(i) සමාජ ආර්ථික බලපෑම. (ලකුණු 06)

(ii) අධ්‍යාපනික ව්‍යාප්තිය. (ලකුණු 06)

(iii) අන්තර්ජාතික සංස්කෘතික සබඳතා (ලකුණු 08)

මෙම ශීර්ෂ යටතේ විමසුමක යෙදෙන්න.

09. (i) නර්තන කලාව හා සංගීතය අතර ඇති සබඳතා විස්තර කරන්න. (ලකුණු 10)

(ii) රූපවාහිනී නර්තන කලා කෘති නිර්මාණයේදී සංස්කෘතිකමය අනන්‍යතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතු කරුණු විමසන්න. (ලකුණු 10)

The National e-learning Portal for the General Education